# පුවත්පත් නිවේදනය

# 2016 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය

**වාරික ආදායම සහ වර්ධන වේගය**


ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයේ වර්ධනය 2016 වසර තුළදී ද තව දුරටත් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර අංශ දෙකෙහිම දළ ලිඛිත වාරිකයෙහි (GWP) වර්ධනයක් සනිටුහන් විය. 2015 වසරේ දී උත්පාදනය කරන ලද සමස්ත දළ ලිඛිත වාරිකය වූ රුපියල් මිලියන 122,962කට සාපේක්ෂව 2016 වසර තුළ අංශ දෙකෙන්ම උත්පාදනය කරන ලද ආදායම රුපියල් මිලියන 142,969ක් වූයේ 16.27%ක වර්ධනයක් පෙන්නුම් කරමිනි.

2015 වසරේ උත්පාදනය කරන ලද රුපියල් මිලියන 53,691ට සාපේක්ෂව, 18.26%ක වර්ධනයක් පෙන්වමින් 2016 වසරේ දී දීර්ඝකාලීන රක්ෂණ අංශයෙන් උත්පාදනය කරන ලද සමස්ත දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 63,495ක් විය. මෙම කැපී පෙනෙන වර්ධනය සඳහා දායක වූ සාධක ලෙස ජීවිත රක්ෂණාවරණ පිළිබඳ දැනුවත්භාවය ඉහළයාම, විශ්‍රාම සැලසුම්, ආයෝජන නිෂ්පාදන, වැඩි දියුණු කළ පාරිභෝගික සේවා, වෙනස් වන පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස නව ජීවිත රක්ෂණ නිෂ්පාදන හඳුන්වාදීම ආදිය දැක්විය හැක.

2016 වසර තුළ සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලිඛිත වාරිකය රුපියල් මිලියන 79,474ක් වූ අතර, එය 2015 වසරේ අගය වූ රුපියල් මිලියන 69,271 ට සාපේක්ෂව 14.73%ක වර්ධනයකි. සාමාන්‍ය රක්ෂණ වෙළඳපල සඳහා පවතින දැඩි තරඟකාරිත්වය හමුවේ විශේෂිත කුඩා වෙළඳපල පිළිබඳ අවධානය යොමුකිරීම, නව සාමාන්‍ය රක්ෂණ නිෂ්පාදන හඳුන්වාදීම, ව්‍යවසාය අවදානම් කළමනාකරණ ක්‍රමෝපායන් හඳුන්වාදීම, අවදානම් තෝරාගැනීම සහ මිළකරණය පිළිබඳව අවධානය යොමුකිරීම ආදී ක්‍රමෝපායන් හරහා ස්වකීය වාරික ආදායම ස්ථාවර ලෙස ඉහළ නංවා ගැනීමට සාමාන්‍ය රක්ෂණ සමාගම් වලට හැකියාව ලැබුණි.

2016 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි අනිවාර්ය ප්‍රතිරක්ෂණ පවරාදීම් මගින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් උත්පාදනය කළ ප්‍රතිරක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 2,357ක් වූ අතර එය 2015 වසරේ උත්පාදනය කළ රුපියල් මිලියන 1,738ට අනුව 35.62%ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන්ම, පුළුල් පරාසයක පිහිටි සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල විවිධ වර්ගයේ ප්‍රතිරක්ෂණ ව්‍යාපාර

භාරගැනීම හේතුකොටගෙන 2016 වසරේ ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ වාරිකය සැලකිය යුතු ලෙස ඉහළ නැඟ තිබුණි.




### රක්ෂණ ව්‍යාප්තිය සහ ඝනත්වය

දළ දේශීය නිෂ්පාදනයෙහි ප්‍රතිශතයක් ලෙස දැක්වෙන රක්ෂණ ව්‍යාප්තිය 2016 වසරේ දී 1.21% ක් විය. 2015 වසරේ වාර්තා වූ අගය වන 1.12%ට සාපේක්ෂව 2016 වසර තුළ රක්ෂණ ව්‍යාප්තිය ඉහළ ගොස් තිබුණ ද ආසියානු කලාපයේ අනිකුත් රටවල් බොහොමයකට සාපේක්ෂව එය තවමත් පහළ මට්ටමක පවතී. 2016 වසරේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන්හි ව්‍යාප්තිය 0.54% (2015: 0.49%)ක් ද, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි ව්‍යාප්තිය 0.67% (2015: 0.63%) ක් ද වූ අතර, 2015 වසරේ වාර්තා වූ අනුපාතයන්ට සාපේක්ෂව එම ව්‍යාපාර දෙවර්ගයෙහිම සුළු වැඩිවීමක් දක්නට ලැබුණි.


රක්ෂණ ඝනත්වය යන්නෙන් ජනගහනයෙහි එක් පුද්ගලයෙක් සඳහා වන රක්ෂණ වාරික ආදායම පිළිබිඹු වන අතර, 2015 වාර්තා වූ රුපියල් මිලියන 5,865ට සාපේක්ෂව, 14.97%ක වර්ධනයක් පෙන්නුම් කරමින් රුපියල් මිලියන 6,743ක් දක්වා ඉහළ යාමට ප්‍රධාන හේතුව වූයේ ජනගහනයෙහි සුළු වැඩිවීමට සාපේක්ෂව වාරික ආදායම ඉහළ යාමයි.

### මුළු වත්කම්

දිගු කාලීන සහ සාමාන්‍ය රක්ෂණ සමාගම් වලට මෙන්ම ජාතික ප්‍රතිරක්ෂකයා වූ ජාතික රක්ෂණ භාරකාර අරමුදලටත් අයත් වත්කම්වලින් සමන්විත රක්ෂණ කර්මාන්තයෙහි මුළු වත්කම් ප්‍රමාණය (අන්තර්-අංශ ගණුදෙනු ඉවත්කිරීමෙන් පසු) 2016 දෙසැම්බර් 31 දිනට


රුපියල් මිලියන 527,228ක් විය. 2015 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රුපියල් මිලියන 466,707ක වත්කම්වලට සාපේක්ෂව මෙය 12.97%ක ඉහළ යාමකි.

ප්‍රතිරක්ෂණ ව්‍යාපාරවලට අයත් වත්කම් වලින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් හිමිකරගෙන තිබූ වත්කම් ප්‍රමාණය, 2016 දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 5,915ක් වූ අතර, එය 2015 වත්කම් ප්‍රමාණය වූ රුපියල් මිලියන 3,604ට සාපේක්ෂව 64.12%ක ඉහළ යාමකි. වත්කම්වල ඉහත දක්වූ ඉහළයාමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රක්ෂණකරුවන්ගේ සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙහි වත්කම් පදනම පුළුල්වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ඇති වී තිබෙන දීර්ඝකාලීන සහ සාමාන්‍ය රක්ෂණ වාරික ආදායමෙහි සහ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරවල වර්ධනයයි.





**රක්ෂණ සමාගම් විසින් දරන ලද හිමිකම්**

දිගුකාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය තුළින් රක්ෂණ සමාගම් දරන ලද රක්ෂණ හිමිකම් ප්‍රමාණය රු. මිලියන 63,638 (2015: රුපියල් මිලියන 54,356) වන අතර, එය පසුගිය වසරට සාපේක්ෂව මුළු හිමිකම් ප්‍රමාණයෙන් 17.08% කින් වැඩිවී ඇත. කල්පිරීම් සහ මරණ ප්‍රතිලාභ ඇතුළුව දීර්ඝ කාලීන රක්ෂණ හිමිකම් ප්‍රමාණය රු. මිලියන 22,622 ක් විය. (2015: රුපියල් මිලියන 20,934). මෝටර් රථ, ගිනි, සමුද්‍ර සහ අනෙකුත් කාණ්ඩවල සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන් තුළින් දරන ලද හිමිකම් ගෙවීම් රු. මිලියන 41,015 කි (2015: රුපියල් මිලියන 33,422). එබැවින්, 2015 වසර හා සංසන්දනාත්මකව දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සඳහා දරන ලද හිමිකම් ප්‍රමාණය පිළිවෙලින් 8.07% ක් සහ 22.72% ක වැඩිවීමක් දක්නට ලැබේ.




**රක්ෂණ සමාගම්වල ලාභය (බද්දට පෙර)**

දිගුකාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර දෙවර්ගය සඳහා රක්ෂණ සමාගම්වල බදු ගෙවීමට පෙර ලාභය රු. මිලියන 24,651කින් ඉහළ ගොස් ඇත්තේ (2015: රුපියල් මිලියන 17,489) ලාභයෙහි 40.95% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කරමිනි. වර්ෂය අවසානයේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයන්හි ලාභය (බදු ගෙවීමට පෙර) රු. මිලියන 11,511 (2015: රුපියල් මිලියන 8,411) ක් වූ අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි ලාභය (බදු ගෙවීමට පෙර) රු. මිලියන 13,139 ක් විය. (2015: රුපියල් මිලියන 9,078). මේ අනුව, දීර්ඝ කාලීන සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි බදු ගෙවීමට පෙර ලාභය පිළිවෙලින් 23.72% සහ 44.74% ක වර්ධනයක් පෙන්නුම් කර තිබේ.




## ආරවුල් නිරාකරණය සහ විමර්ශන

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ සිය සමස්ත අරමුණ යටතේ ජීවිත රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ඔප්පු වලට අදාළ රක්ෂණ හිමිකම් සම්බන්ධ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විමර්ශන සිදුකරනු ලබයි. රක්ෂණ සමාගමකට රක්ෂණ තැරැව්කාර සමාගමකට හෝ රක්ෂණ නියෝජිතයෙකුට එරෙහිව යොමු කරනු ලබන ඕනෑම වෙනත් පැමිණිල්ලක් සම්බන්ධයෙන් ද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විමර්ශනය කරයි. 2016 වන විට නව පැමිණිලි 353 ක් මණ්ඩලය වෙත යොමු කරන ලදී. කාලපරිච්ඡේදය තුළදී පැමිණිලි 345 ක් විසඳා/අවසන් කර ඇත. රක්ෂණ මණ්ඩලයේ මැදිහත් වීම හේතු කොට ගෙන අදාල කාලපරිච්ඡේදය තුළ ගෙවා ඇති හිමිකම්වල සමස්ත වටිනාකම රු. මිලියන 21.5 කි.

## රක්ෂණකරුවන්

2016 දෙසැම්බර් 31 දිනට ක්‍රියාත්මක රක්ෂණ සමාගම් (රක්ෂණ ආයතන) විසි අට (28)ක් අතරින්, සමාගම් දොලහක් (12) දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර පමණක් ද සමාගම් දහතුනක් (13) සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර ද පවත්වාගෙන යන අතර, තුනක් (03) සංයුක්ත (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරවල යෙදී සිටින) සමාගම් වේ.

## රක්ෂණ තැරැව්කරුවන්

2016 දෙසැම්බර් 31 වන දිනට රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වූ රක්ෂණ තැරැව්කාර සමාගම් 58 හි අවධානය ප්‍රධාන වශයෙන්ම යොමු වී ඇත්තේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කෙරෙහිය.

සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර හරහා ජනනය කරන ලද වාරික ආදායම සාමාන්‍ය රක්ෂණ වෙළෙඳපොළ තුළ මැදිහත්කරුවකු ලෙස තැරැව්කරුවන්ගේ වැදගත්කම පෙන්නුම් කරයි. කෙසේවෙතත්, 2016 වසර තුළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සඳහා රක්ෂණ තැරැව්කරුවන්ගේ දායකත්වය පෙර වසරවල දී මෙන්ම මෙවරද දැකගත නොහැකි විය. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා ජනනය කරන වාරික ආදායම රු. මිලියන 17,519 (2015: රුපියල් මිලියන 16,124)ක් වූ අතර, දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර සම්බන්ධයෙන් ජනනය වූ වාරික ආදායම රු. මිලියන 263 (2015: රුපියල් මිලියන 206)කි. සාමාන්‍ය සහ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරවලින් ජනනය කරන ලද මුළු වාරික ආදායම පසුගිය වසර තුළ අගය වූ මිලියන 16,330 කට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් මිලියන 17,782 ක් විය. මේ අනුව, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර හරහා ජනනය කළ මුළු වාරික ආදායම පසුගිය වසරට සාපේක්ෂව 8.89% ක වර්ධනයක් පෙන්නුම් කරයි. කෙසේවෙතත්, සමස්ත දළ වාරික ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස තැරැව්කාර සමාගම්වල දායකත්වය 2015 වසරේ දී වාර්තා වූ 13.28% සිට 12.44% දක්වා අඩු වී ඇත.

*සටහන:*

*1) 2016 - යාවකාලීන සංඛ්‍යා*

*2) වත්කම් - අන්තර් අංශ ශේෂයන් (එනම් දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ඛණ්ඩයන් අතර ගනුදෙනු) ඉවත් කර ඇත*

*3) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි සහ සණසෙහි කොටස්කරුවන්ට අයත් වත්කම් පොදු රක්ෂණ යටතේ වාර්තා කර ඇත*

*4) ජාතික රක්ෂණ භාර අරමුදලෙහි බෝග සහ ණය ආරක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආදායම් සහ වත්කම් රක්ෂණ සංඛ්‍යා ලේඛණ ආගණනයෙන් ඉවත් කර ඇත*

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය
11 වන මහල, නැගෙනහිර කුළුන
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
කොළඹ 01.

| දුරකතන: 011 2396184- 9 | ෆැක්ස්: 011 2396190 |
|---|---|
| වෙබ් අඩවිය: www.ibsl.gov.lk | විද්‍යුත් ලිපිනය: info@ibsl.gov.lk |

**2017/08/14**